ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය

කොළඹ

***

**<u>පුවත්පත් නිවේදනය</u>**

**<u>2021-22 මූල්‍ය වර්ෂය සඳහා ඉන්දියාවේ අයවැය</u>**

මුදල් අමාත්‍ය නිර්මලා සීතාරාමන් මහත්මිය පළමු නිර්ලේඛන (ඩිජිටල්) අයවැය 2021 පෙබරවාරි පළමු වන දින ඉදිරිපත් කළාය. 2021-22 මූල්‍ය වර්ෂය සඳහා අයවැය ඉදිරිපත් කෙරුණේ ඉන්දියාව කොවිඩ්-19 වසංගතය විසින් මතු කර ඇති අභියෝගයන් ජයගනිමින් ශක්තිමත්ව V හැඩයේ ආර්ථික පුනර්ජීවනයක් ළඟා කරගැනීමට කටයුතු කරමින් සිටින අවස්ථාවකදී ය. ඉන්දියාවේ මූර්ත දළ දේශීය නිෂ්පාදිතය මූල්‍ය වර්ෂ 2021-22 වර්ෂයේදී 11.5%කද 2022-23 මූල්‍ය වර්ෂයේදී 6.8%කද නව වාර්තාගත වර්ධනයක් සටහන් කරනු ඇතැයි ඇස්තමේන්තු කර ඇත. ඒ අනුව ඉන්දියාව ඉදිරි වසර දෙක තුළදී ලොව වේගයෙන්ම වර්ධනය වන ආර්ථිකය බවට පත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. එසේම, 2024-25 මූල්‍ය වර්ෂය සඳහා ඇමරිකානු ඩොලර් ට්‍රිලියන 5ක ආර්ථිකයක් දක්වා වර්ධනය වීමට ඉන්දියාව ඉලක්ක කර ඇත. මූල්‍ය වර්ෂ 2020-21 හි දෙවන අර්ධය තුළ (2020 ඔක්තෝබර් සිට 2021 මාර්තු දක්වා) ශක්තිමත් ආර්ථික පුනර්ජීවනයක් සමඟින් ඉන්දියාව මෙම ඉලක්කයන් ළඟා කර ගැනීමට සමත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

2. ආර්ථිකයේ ශක්තිමත් ක්‍රියාකාරීත්වය ආයෝජක ආකර්ෂණය ඉහළ නැංවීමට සමත් වී තිබේ. 2020 නොවැම්බර් මාසයේදී විදේශීය කළඹ ආයෝජන මෙතෙක් මාසිකව වාර්තා කරන ලද ඉහළම අගය වන ඇමරිකානු ඩොලර් බිලියන 9.8ක අගයක් වාර්තා කළේය. විදේශීය සංචිත ද ඇමරිකානු ඩොලර් බිලියන 586ක වාර්තාගත ඉහළ අගයක් සටහන් කළ අතර අය ඉන්දියාවේ මාස 18ක ආනයන ආවරණය කිරීමට ප්‍රමාණවත් වේ. කොටස් වෙළඳපොළ දර්ශකයන් ශක්තිමත් ක්‍රියාකාරීත්වයක් පෙන්නුම් කර ඇති අතර දළ දේශීය නිෂ්පාදිතයට ප්‍රාග්ධනීකරණ අනුපාතය වසර 10කට අධික කාලයකින් අනතුරුව 100% ඉක්මවා ගියේය.

3. කොවිඩ් වසංගතය සඳහා රජයේ ශික්ෂිත සහ පරිණත ප්‍රතිපත්තිමය ප්‍රතිචාර ඉන්දියාවේ ශක්තිමත් ආර්ථික පුනර්ජීවනයට හේතු විය. රජයේ ප්‍රතිචාරයන් සීමාකිරීම් ක්‍රමවේදය, ෆිස්කල්, මූල්‍ය සහ දිගුකාලීන ව්‍යුහමය ප්‍රතිසංස්කරණ යන සිව් වැදෑරුම් ප්‍රතිපත්තීන් මත පදනම් විය. රට වසා දමා තිබූ කාල සීමාව තුළ දුර්වල කණ්ඩායම් සඳහා අවශ්‍ය සහන සැපයීම

සහ ක්‍රමයෙන් රට විවෘත කිරීමේදී පරිභෝජන සහ ආයෝජන දිරිමත් කිරීම වැනි ක්‍රියාමාර්ග ද මේ හා සමාන්තරව ගන්නා ලදී.

4. 2021-22 මූල්‍ය වර්ෂය සඳහා ඉන්දියාවේ සමස්ත වියදම ඇමරිකානු ඩොලර් බිලියන 500කට ආසන්න වේ. ගෝලීය ආර්ථික අවපාතය හමුවේ පවා 2020-21 මූල්‍ය වර්ෂයේ පළමු අර්ධය තුළ 3.4%ක වර්ධනයක් සටහන් කළ ඉන්දියාවේ කෘෂිකාර්මික අංශය සඳහා අයවැයෙන් විශාල සානුබලයක් සපයා ඇත. කෘෂිකාර්මික ණය ඉලක්කය ඇමරිකානු ඩොලර් බිලියන 226 දක්වා ඉහළ නංවා ඇති අතර දැනටමත් ක්‍රියාවට නංවා ඇති ප්‍රගතිශීලී ප්‍රතිසංස්කරණ ඉදිරියට ගෙන යමින් විවිධ ගොවි හිතකාමී පියවර අයවැයෙන් යෝජනා කර ඇත. මෙම පියවර 2022 වර්ෂය වන විට ගොවියාගේ ආදායම දෙගුණ කිරීමේ ඉලක්කය හා සමාන්තර වේ. රක්ෂණ ක්ෂේත්‍රයේ සෘජු විදේශ ආයෝජන සීමාව 49% සිට 74% දක්වා ඉහළ නැංවීම වැනි ආයෝජකයන්ට හිතකර පියවර රැසක් මගින් තවදුරටත් විදේශ ආයෝජන දිරිමත් කිරීමට ද කටයුතු කර ඇත.

5. මුදල් අමාත්‍යතුමිය ස්වයං පෝෂිත ඉන්දියාවක් (ආත්ම නිර්භාර් භාරත්) යන දැක්ම අයවැය තුළ අවධාරණය කරන ලදී. යටිතල පහසුකම් ශක්තිමත් කිරීම, තරුණ ප්‍රජාව සඳහා අවස්ථාවන් ලබා දීම, සැමට අධ්‍යාපනය ලබා දීම, කාන්තාවන් ඇතුළු සැම සවිබල ගැන්වීම යනාදී විවිධ අංශ මෙවර අයවැයට ඇතුළත් වේ. මෙම අයවැය සෞඛ්‍ය සහ යහ පැවැත්ම, මූර්ත සහ මූල්‍ය ප්‍රාග්ධනය සහ යටිතල පහසුකම්, සියළු අංශ ඇතුළත් වන සංවර්ධනයක්, මානව ප්‍රාග්ධනය බලගැන්වීම, නව්‍යකරණය සහ පර්යේෂණ සහ සංවර්ධන සහ අවම පිරිසකින් උපරිම ප්‍රතිඵල ලබා ගැනීම (minimum Government and Maximum Governance) යන ප්‍රධාන කුළුණු හය මත ගොඩනගා ඇත. මේ යටතේ නිෂ්පාදනය තවදුරටත් දිරිගන්වා ඇති අතර නව ව්‍යාපාර සඳහා වැඩි අවධානයක් ලබා දී ඇත. අභ්‍යවකාශ ගවේෂණ ක්ෂේත්‍රය සඳහා ද ඉහළ ඉලක්ක ස්ථාපිත කර ඇත.

(ඉන්දියාවේ මූල්‍ය වර්ෂය අප්‍රේල් සිට මාර්තු දක්වා වේ)

***

***කොළඹ***
***2021 පෙබරවාරි 05***